## පළමුවන දේව ප්‍රකාශන

යෙසායා 9:2-7

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය.**

අන්ධකාරයෙහි ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝ ය. ගන අඳුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබළෙන්නේ ය. ඉමහත් ප්‍රීතියක් ඔබ ඔවුන්ට දුන් සේක. ඔවුන්ගේ ප්‍රීති ප්‍රමෝදය වර්ධනය කළ සේක. අස්වැන්න කපන කාලයෙහි සෙනඟ ප්‍රීති වන්නාක් මෙන් ඔබ ඉදිරියෙහි ඔව්හු ප්‍රීති ප්‍රමෝද වෙති. මන්ද යත් ඔවුනට බරක් වූ වියගහ ද කර මත තැබූ වියදණ්ඩ ද ඔබ කඩා දැමූ සේක. පෙර කලක ඔබ මිදියන් හමුදා පරාජය කළාක් මෙන් ඔවුනට පීඩා කළ ජාතිය ඔබ විසින් පරාජය කරනු ලැබීය. ආක්‍රමණය කරන හමුදාවේ පාවහන් ද ලෙයින් තැවරුණු ඔවුන්ගේ ඇඳුම් සියල්ල ද ගින්නෙන් දවාලනු ලැබේ.

අපට ළදරුවෙක් උපන්නේ ය. අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය. එතුමාණෝ අපේ රජු වන සේක. එතුමාණෝ අසිරිමත් උපදේශකයාණෝ ය. ප්‍රතාපවත් දෙවි තුමාණෝ ය. සදාතන පියාණෝ ය. සාමයේ කුමාරයාණෝ ය' යි කියනු ලබන සේක. එතුමන්ගේ රාජ බලය වැඩි වර්ධනය වන්නේ ය. එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන්නේ ය. මෙතැන් සිට සදහට ම දාවිත් රජුගේ සිහසුනේ වැඩ හිඳින එතුමන්ගේ රාජ්‍යය ස්ථිරව පිහිටුවන ලෙස එතුමාණෝ යුක්තියෙන් ද, ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන සේක. සව් බලැති සමිඳුන්ගේ උද්යෝගයෙන් මෙය අධිෂ්ඨාන කළ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 96:1-3, 11-13

**පිළිතුර: ස්වාමින් වන ක්‍රිස්තුන් නම් ගැළැවුම්කාරයෙක් අප හට අද උපන්නේ ය.**

ගීය: සමිඳුන් හට නව ගීයක් ගයන්න. පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී ගයන්න. සමිඳුන් හට ගී ගයා එතුමන්ගේ නාමයට ආසිරි පතන්න. එතුමන්ගේ ගැළවීමේ සුභාරංචිය දිනෙන් දින ප්‍රකාශ කරන්න.

විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න. ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න. සගලොව ප්‍රීති ප්‍රමෝද වේවා! නරලොව තුටු පහටු වේවා! සමුදුරත් එහි ඇති සියල්ලත් ගිගුරුම් දේවා!

කෙත් වතු සහ එහි සියල්ලත් ප්‍රීතිමත් වේවා! එවිට වන රොදෙහි ගස් කොළෙන් ප්‍රීති නාද දෙන්නේ ය. සමිඳාණන් මිහිතලය පාලනය කිරීමට වඩින විට ඒවා නද දෙන්නේ ය. එතුමාණෝ ලෝ වැසියන් සාධාරණ ලෙස ද අවංක ලෙස ද පාලනය කරන සේක.

## දෙවන දේව ප්‍රකාශනය

තීතස් 2:11-14

පාවුළු තුමන් විසින් තීතස්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ගෙන දෙන**

**දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ප්‍රකාශ වී ඇත.**

සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ගෙන දෙන දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ප්‍රකාශ වී ඇත. අභක්තිය ද ලෞකික තෘෂ්ණා ද හැර දමා, ආශිර්වාද ලත් බලාපොරොත්තුව ගැනත් මහෝත්තම දෙවියන් වහන්සේගේ ද අපගේ ගලවුම්කාර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ද තේජාන්විත ආගමනය ගැනත් බලා සිටිමින් සිහි නුවණින් යුතු ව ධර්මිෂ්ඨ ලෙසත් භක්තිවන්ත ලෙසත් මෙලොව ජිවත් වන පිණිස ඒ දේව වර්ප්‍රසාදය අපට අනුශාසනා කරන්නේ ය. සියලු අධර්මිෂ්ඨකම් වලින් අප පවිත්‍ර කරන පිණිසත්, අප උන් වහන්සේගේ තෝරා ගත් සෙනඟක් කරන පිණිසත්, යහපත කිරීමට අප උද්යෝගිමත් කරවන පිණිසත් අප නිදහස් කරන පිණිසත්, උන් වහන්සේ අප උදෙසා දිවි පිදූ සේක.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** ලූක් 2:10-11

ආලේලූයා! ආලේලූයා!
සකල ජනයා හට ඉතා ආනන්දජනක මංගල පුවතක් මම ඔබ වෙත
ගෙනෙමි. ස්වාමින් වන ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක්
ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේය.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 2:1-14

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**ගැළවුම්කාරයෙක් ඔබ හට අද උපන්නේය.**

තවද එසමයෙහි, රෝම අධිරාජ්‍යයේ සියළු වැසියන්ගේ සංගණනයක් ගැනීමට අගෝස්තුස් අධිරාජයා වෙතින් නියෝගයක් නික්මිණි. මේ වනාහි කුරේනියස් සිරියාවේ ආණ්ඩුකාරයාව සිටිය දී කරන ලද පළමු වන සංගණනය යි. සියල්ලෝ ලියාපදිංචි වනු පිණිස තම තමන්ගේ නුවරවලට ගියහ. ජෝසෙප්ද දාවිත්ගේ වංශය හා පෙළපතට අයිති වූයෙන් ගලීලයේ නාසෙරෙත් නුවරින් නික්ම ජුදයේ බෙත්ලෙහෙම් නම් දාවිත්ගේ නුවර බලා ගියේය. ඔහු ගියේ තමාට විවාහ ගිවිසුම් දුන් ගැබ්ගෙන සිටි මරියතුමී සමග ලියාපදිංචි වන පිණිසය. තවද ඔවුන් එහි සිටියදී ඇගේ ප්‍රසව කාලය සම්පූර්ණ විය. ඈ කුළුදුල් පුත්‍රයා බිහි කොට රෙදි වලින් ඔතා, තානායමයෙහි ඉඩකඩ නොතිබුණු බැවින් ගව ඔරුවක බෑවුවා ය.

තවද එම පළාතෙහි එඬේරු රෑ යාමයෙහි සිය බැටළු රැළ රකිමින් පිට්ටනියෙහි සිටියහ. එවිට ස්වාමින් වහන්සේගේ දූතයෙක් ඔහුට දර්ශනය විය. ස්වාමින් වහන්සේගේ තේජශ්‍රීය ඔවුන් සිසාරා බැබළිණි. ඔව්හු අතිශයින් බියපත් වූහ.

එහෙත් දේව දූතයා ඔවුන්ට කථා කොට "බිය නොවන්න, මෙන්න සකල ජනයා හට ඉතා ආනන්දජනක මංගල පුවතක් මම ඔබ වෙත ගෙනෙමි. මක්නිසාද, ස්වාමින් වන ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේය. රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේය. එය ඔබට සලකුණය" යි කීය. ඒ ඇසිල්ලෙහිම දේව දූතයා සමග ස්වර්ග සේනා සමූහයක් දෙවියන්වහන්සේ පසසමින්,

"අති උසස් තැන්හී දෙවිඳුන්ට මහිමය ද මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා" යි ගැයූ හ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.